විද්‍යාලය : -  ර/තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

සිංහල භාෂාව හා සාහිත්‍යය:-  12 ශ්‍රේණිය පැවරුම්

සිංහල විෂය භාර ගුරු:-   ඕ.එම්.එන්.කරුණාරත්න

පුරාතන පද්‍ය :- ගුත්තිල කාව්‍යය

**01.පහත කවි ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .**

සදවා සුදු වැලි    පිවිතුරු

බඳවා රන් දද   පියකරු

සිටුවා දොර දොර රඹ තුරු

තබවා පුන් කුඹු  විසිතුරු

සරා සලෙලු දන    සතොසේ

සුරා පාන කරන     ලෙසේ

පුරා අවුළු නොයෙක    රසේ

සරා අවන් හල්     **සහසේ**

1. තද කළු අකුරින් මුද්‍රිත පද සඳහා අර්ථ සපයන්න ?
2. දොරක් දොරක් පාසා තබා ඇත්තේ හා සිටුවා ඇත්තේ මොනවාද ?
3. “සරා සලෙලු දන සතොසේ” යන්නෙට  අර්ථ විවරණ සපයන්න ?
4. සරා අවන් හල් යන්නෙහි ඇති ‘සරා’යන පදයේ ව්‍යාකරණ විභාග දක්වන්න

**02.ගුත්තිල කතුවරයාගේ කාව්‍යාලංකාර භාවිතය පිළිබඳව නිදසුන් තුනක් ඇසුරෙන් දක්වන්න ?**

● පිළිතුර ලිවීමට අත්වැලක්

☞ කතු හිමියන්ගේ ශබ්දාලංකාර භාවිතය හා අර්ථාලංකාර භාවිතය පිළිබඳව විස්තර කිරීම . ඒවායේ අපූර්වත්වය ,උචිත බව,අරුත්පල බව දැක්විය යුතුය .

☞ශබ්දාලංකාර

එළිසමය ,අනුප්‍රාසය ,විරිත්,ලය

☞අර්ථාලංකාර

උපමාලංකාර,රූපකාලංකාර,ස්වභාවෝක්ති අලංකාර,අතිශයෝක්ති අලංකාර...ආදිය

☞"පසු කර රුසිරෙන් සිරඹා" පද්‍ය -අතිශයෝක්ති අලංකාරය

☞ "ඔහු තෙද දිවස කර" පද්‍ය - රූපකාලංකාර

☞ "බරණැස් නුවර සිට" පද්‍ය -ස්වභාවෝක්ති අලංකාර

☞ "රැගත් සුරා පිරූ විතින්" පද්‍ය -එළිසමය

☞ "සුරඟන රඟ රඟ හළුවෝ"පද්‍ය-අනුප්‍රාසය

☞ "මෙන් රිවි සඳ කිරණ"පද්‍ය උපමාලංකාර